# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/52 – 2022 සැප්තැම්බර් 28 වැනි බදාදා – 2022.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 898 හඳුගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හඳුගල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේයූ/පීඑල්ජී/2020/484 හා 2020.12.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ හෙක්ටයාර් 0.1699 යුත් පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 - ක්වින්ස්ලන්ඩ් වත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0915**

උතුරට: වහුම්පුරයලාගේ රසික කුමාර මනෝරත්න හිමිකම් කියන ක්වීන්ස්ලන්ඩ්වත්ත; නැගෙනහිරට: වහුම්පුරයලාගේ රසික කුමාර මනෝරත්න හිමිකම් කියන ක්වීන්ස්ලන්ඩ්වත්ත, මාර්ගය සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; බටහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

02. **කැබලි අංක 2 - ක්වින්ස්ලන්ඩ් වත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0784**

උතුරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: ලියන රාළලාගේ සරත් කුමාර විජේසිංහ හිමිකම් කියන ක්වීන්ස්ලන්ඩ්වත්ත; බටහිරට: ලියන රාළලාගේ සරත් කුමාර විජේසිංහ හිමිකම් කියන ක්වීන්ස්ලන්ඩ්වත්ත.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2020/HW/140.
2022 අගෝස්තු මස 22 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 09-0299



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*